# රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල
# 3 ශ්‍රේණිය - 2020
# මව්බස
# පළමු වාර පාඩම් අභ්‍යාස - 01

- දෙමාපියන් සඳහා උපදෙස්
  - සියලුම විෂයන් සඳහා එකම පොතක් භාවිතා කරන්න.
  - ප්‍රශ්න දෙමාපියන් විසින් පොතේ ලියා දෙන්න. හැකි අය මෙම අභ්‍යාස මුද්‍රණය කර දරුවාට දෙන්න.
  - පිළිතුරු පමණක් දරුවාට ලියන්න දෙන්න.
  - හැකිනම් පිළිතුරු හා අකුරු නිවැරදි කරන්න.
  - මෙම අභ්‍යාස වයිබර් කණ්ඩායම් මගින් හුවමාරු කර ගන්න.
  - පාසල ආරම්භ වන දින මෙම පොත රැගෙන එන්න.

**<u>මෙම වැඩ පැවරුම සිදුකිරීමට වැඩිහිටි අයෙකුගේ සහය ලබාදෙන්න.</u>**

01. මෙම ඡේදය දරුවාට තෙවරක් සවන්දීමට සලස්වන්න.

> සුනිල් වලව්වේ වත්තට බැස්සේ ය. එහි පේර ගස් දෙකත්, බුලත් වැල ගිය කහට ගසත්, මී කළය තිබුණු කජු ගසත් පැණි වරකාවත් පසු කර පහළට ගියේ ය. වැට අද්දරට ගියේ ය. ඔහු සෙමෙන් සෙමෙන් වැටෙන් පැන්නේය. පැන ඇඹුල් පේර ලන්දට සේන්දු විය. ඇඹුල් පේර ඉදී තිබිණි. ඔහු ලහි ලහියේ එකක් දෙකක් කඩා ගත්තේ ය. කෑවේ ය. ඒවා මී ම මී පැණි රස ය. කලිසන් සාක්කු දෙක ම ඔහු ඇඹුල් පේරවලින් පුරවා ගත්තේ ය. පසු ව කමිසය ඇතුළට ඉග වටා ඇඹුල් පේර ලා ගත්තේ ය.
>
> අඹ යහළුවෝ - ටී. බී. ඉලංගරත්න

02. ඡේදය ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු වාචිකව ලබා ගන්න.
   1) මෙම ඡේදයේ සඳහන් වන ළමයාගේ නම කුමක්ද?
   2) වලව්වේ වත්තේ තිබුණු ගස් මොනවාද?
   3) ළමයා කඩා ගත්තේ මොනවාද?
   4) ඔහු කඩාගත් දේ පුරවා ගත්තේ කොහේද?

03. ඉහත දක්වන ලද ඡේදයේ පිටපතක් {අතින් ලියා හෝ } දරුවාට ලබා දෙන්න.

04. පහත සඳහන් වචන පවසන විට ඡේදයේ ඇත්නම් එම වචන රවුම් කිරීමට උපදෙස් දෙන්න.

| |
|---|
| වලව්වේ , මී කළය , මී පැණි , ඇඹුල් පේර , |
| බුලත් වැල , පැණි වරකා , පේර ගස , කහට ගස |

05. එම වචන කියවීමට පවසන්න.

06. එම වචන රූලෙන් 3/4 ප්‍රමාණයට බලා ලිවීමට පවසන්න.

07. ඡේදයේ පළමු වාක්‍ය සහයවන්නාත් දෙවන වාක්‍ය දරුවාත් ආදී වශයෙන් දෙවතාවක්වත් කියවන්න.

08. පහත පැවරුමේ පිටපතක් දරුවාට ලබා දෙන්න.

**ගැළපෙන වැකි කොටස් යා කරන්න.**

| | |
|---|---|
| බුලත් වැල ගිය | ලන්ද |
| මී කළය තිබුණු | රසය |
| ඇඹුල් පේර | වත්ත |
| වලව්වේ | කජු ගස |
| මී පැණි | කහට ගස |

09. ප්‍රශ්න අංක 04 හි වචන අසා ලිවීමට දෙන්න.